පූජ්‍ය අම්පාරේ ආනන්ද හිමි

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

*Paper: Diversity*

# අභිචාර හා විද්‍යාව

අභිචාර හා විද්‍යාව යනු අන්ත දෙකක දිවෙන විෂය පථ දෙකකි. විද්‍යාව ස්වභාව ධර්මයේ භෞතික දේ පිළිබඳ විශ්වාසය තබා කටයුතු කරන අතර අභිචාර ස්වභාව ධර්මයේ අභෞතික බලවේග පිළිබඳ අවධානය යොමු කරයි. අභිචාර තුළ මෙන් ම විද්‍යාව තුළ ද විශ්වාස ඇතී ස්වභාව ධර්මයේ සිද්ධි අතර කිසියම් හේතුඵල සබඳතාවක් තිබෙන බව විශ්වාස කෙරේ. එම සිද්ධි පුරෝකථනය කළ හැකි බව විද්‍යාවේ මූලික විශ්වාසයකි.

මිථ්‍යා ඇදහිලි හා විශ්වාස මත පදනම් ව ප්‍රාථමික ජන සමාජයේ අවශ්‍යතා අනුව ප්‍රභවය වූයේ යැයි සැලකෙන අභිචාර යුග ගණනක් මුළුල්ලේ අඛණ්ඩව පැමිණ, විද්‍යාව හා තාක්ෂණය දියුණු සංකීර්ණ සමාජය තුළ ද පවතී. අභිචාර යුග ගණනක් සමාජයේ පැවතීමට නම් එමගින් කුමන හෝ සේවාවක් සමාජයට ඉටු විය යුතු ම වේ. අභිචාර හා සම්බන්ධ විද්‍යාත්මක පදනම එහිලා මුල් වන්නට ඇතැයි සැලකිය හැකිය.

අභිචාර සඳහා විද්‍යානුකූල පදනමක් ද පැවති බව අනාවරණය වී තිබේ. ජීවිතය හා සබැඳි සෑම කටයුත්තක දී ම අභිචාර විධි ද අනුගමනය කරන ට්‍රෝබ්‍රියන්ඩ් ( Trobriand ) දූපත්වාසීන්ගේ සෑම අභිචාර විධියක ම පාහේ විද්‍යානුකූල පදනමක් පැවතී තිබේ. සිය ජීවන වෘත්තීන් වන මසුන් මැරීමට, ගොවිතැනට යොදා ගන්නා උපකරණ සෑදීමේ දී අභිචාර විධි උපයෝගී කරගත්ත ද ඒවා දේශගුණික තත්ත්වයට ගැළපෙන අයුරින් සැකසීමට තරම් තාර්කික බුද්ධියක් ඔවුනට තිබී ඇත. අප රටෙහි ගොවි ජනතාව ගොයම කීඩෑ උවදුරෙන් ගලවා ගැනීමට අළු බඳුනක් ගෙන අළු' මන්ත්‍රය නමැති මන්ත්‍රයකින් ජප කොට අලුයම නිරුවතින් කුඹුරට ගොස් අළු ඉසී මෙන් පසු කීඩෑ උවදුර දුරුවන බව විශ්වාස කරති. මෙහි විද්‍යානුකූල පසුබිම මෙසේය. අලුයම වනවිට ගොයම මත පිණි හොඳින් වැටී තිබේ. ඒ හේතුවෙන් අළු ගොයම මත හොඳින් තැවරේ. කීඩෑවන්ගේ ස්වසනයට බාධා ඇති වී මිය යයි. නිරුවතින් යන්නාට හිරු උදා වූ පසුව යා නොහැක. නිරුවතින් යාමට නොකීවේ නම් හිරු උදා වූ පසු ව යාමට ද පෙළඹේ. ඒ හිරු උදා වූ පසු පින්න වියැළී ගොස් යී අදාළ ප්‍රතිඵල නො ලැබේ.

විද්‍යාව හා තාක්ෂණය කොතරම් දියුණු වුව ද විද්‍යාවෙන් ඔබ්බට මිනිසාට පිහිට වනුයේ අධිභෞතික බලවේග මත පදනම් වූ විවිධ අභිචාර පිළිවෙත් ය. විද්‍යාව හා අභිචාර අතර යම් සබඳතාවක් ඇත. මේ දෙකෙන් ම මානව සමාජයට මහඟු සේවයක් සැලසේ.